1/7/71

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,914 — 1970 ජූලි 10 වැනි සිකුරාදා — 1970.7.10

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 493 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| කනතුරු-ඇබෑර්තු ... ... ... | 494 | අය-වැය ලේඛන ... ... ... | 497 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | දේපල විකිණීම ... ... ... | — |
| අනුරූ ව්‍යවසාය ... ... ... | — | මාර්ග කොමිටි දැන්වීම ... ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | 497 | විවිධ දැන්වීම ... ... ... ... | 499 |


## පළාත් පාලන නිවේදන

ඒ/161/12.

### ගම්සභා ආඥාපනත

#### 17 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

1961 අංක 60 දරණ පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතින් 17 (5) වැනි වගන්තියෙන් මා කෙරෙහි පැවරී ඇති බලතල ප්‍රකාර, කොළඹ දිසාවේ පළාත් පාලන සහකාර කොමසාරිස් ඇම්. බී. සමරකෝන් වන මා විසින් කොළඹ දිස්ත්‍රික්කයේ හෙනරත්ගොඩ ගම්සභාවේ රැස්වීමක් 1970 ජූලි මස 17 වැනි දින පෙ. ව. 9.30 ට හෙනරත්ගොඩ ගම්සභා කාර්යාලයේදී එම ගම්සභාවට සභාපතිවරයෙකු තෝරා පත්කර ගැනීම පිණිස මෙයින් කැඳවා සිටිනු ලැබේ.

ඇම්. බී. සමරකෝන්,<br>
පළාත් පාලන සහකාර කොමසාරිස්,<br>
(කොළඹ දිසාව).

1970 ජූලි මස 9 වෙනි දින,<br>
බම්බලපිටියේ පළාත් පාලන අමාත්‍යාංශ<br>
ප්‍රාදේශීය කාර්යාලයේදීය.

7–419—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම භාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,<br>
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව,<br>
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,<br>
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

5. සෑම අයදුම්කරුවෙකු විසින්ම, තමා ලාංකිකයකු බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි. "ලාංකිකයා" යනු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියෙකු වූවෙකි.

6. **සේවාමුක්ත භටයින් සඳහා අනුග්‍රහ.**—(අ) සේවාමුක්ත වූ අයදුම් කරුවනට, ඔවුන්ගේ නිත්‍ය භට හමුදා සේවා කාලය, තම වයසින් අඩුකර ගැනීමෙන්, ඉල්ලුම්කර ඇති තනතුරුවල නියමිත උපරිම වයස් සීමාව ඇතුළතට පැමිණිය හැකිවන අවස්ථාවක නිත්‍ය භට සේවා කාලපරිච්ඡේදය එසේ අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

(ආ) සේවයේ යම්කිසි තනතුරක් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පරිපාටියෙහි නියමිත අඩුම අධ්‍යාපන සුදුසුකම, ඊළඟට පහළින් ඇති විභාගය දක්වා අඩු කිරීමට සේවා මුක්තයන් වන අයදුම්කරුවනට අවසර දෙනු ලැබේ.

7. **වයස පිළිබඳ අනුග්‍රහය.**—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළ කෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකාම අයදුම්පත් එවීමට ස්ථිර තනතුරක් දරණ, වර්ෂ දෙකක අඛණ්ඩ සේවාවක් ඇති ප්‍රාදේශීය බලමණ්ඩලයන්හි සේවකයන්ට පුළුවන.

8. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන් අයදුම්පත් තම තමන් සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩල සභාපති මගින් හෝ නාගරික කොමසාරිස්වරයා මගින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දැනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිධලාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ග යෙනි. ආණ්ඩුවේ සේවයේ ස්ථිර තනතුරු දරණ නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරාගනු ලැබුවහොත්, ඔවුන් ස්වකීය තනතුරුවලින් මුදගන්නට තමන් සූදානම්ව සිටිත්ද නැද්දැයි සඳහන් කළ යුතුය.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකිය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක්, අන්කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iv) කිසිම අපේක්ෂකයෙකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම්, ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බලපැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන්ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන්කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම්, ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුස්සකු බවට පත්කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම්, රාජකාරියෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැල පෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) පහත සඳහන් ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත්, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ.) එවිය යුතුයි.

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සළකා බලනු නොලැබේ. අයදුම්පතක් තැපැලේදී ප්‍රමාද වූ බවට හෝ නැති වූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු ස්වකීය අයදුම්පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තුමූම ඒ අවදානමට මුහුණ පාති.

**අන්‍යාකාරයකින් සඳහන්කොට නැති කල්හි භාවිතා කළ යුතු අයදුම්පත් ආකෘතිය**

## පළාත් පාලන සේවය

සැ.යු.—(i) අයදුම් පත්‍ර පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට, තනතුරු අදාළ වන ගැසට් නිවේදනයෙහි සඳහන්, අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු, කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම් පත්‍ර, ලේකම්ගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැළකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවෝ වග බලාගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවෝ ස්වකීය අයදුම් පත්‍රවලට ඇමිණිය යුතුය. (i) ඉංග්‍රීසි, සිංහල, දෙමළ යන භාෂාවලින් සමත්වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (2) චරිත සහතිකය (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදළවන වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැළකිල්ල යොමු කරන්න.

——————————තනතුර සඳහා වූ අයදුම් පත

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය :————.
(ආ) ඉල්ලුම්කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.
ජාතිය :————.
(එම ලියාපදිංචිවීමෙන් ලාංකිකයෙකු වී නම්, පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත්, සැදැහුම් අංකයත් සඳහන් කරන්න.)

3. තැපැල් ලිපිනය :————
(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයට නියම වයස :—
අවුරුදු :———, මාස :———, දින :———.
(ආ) උපන් දිනය :——.

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—
(අ) අයදුම්කරු :————
(ආ) අයදුම්කරුගේ පියා :————.
(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.
(ඈ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————.
(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ), (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) පිරවිය යුතුයි.)

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :———.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

| සාමාන්‍ය අධ්‍යාපනය | | |
|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

| වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය | | |
|---|---|---|
| විද්‍යායතනය | සිට | දක්වා |
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයත් සමග : —
(අ) සිංහල :————.
(ආ) ඉංග්‍රීසි :————.
(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතනවල නම :————.

10. වෘත්තීය/කාර්මික/කර්මාන්ත පළපුරුද්ද :—.

| ආයතනයේ නම | ආධුනිකත්වයේ ස්වභාවය/ දැරූ තනතුර | සිට | දක්වා |
|---|---|---|---|
| | | | |

(සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි.)

11. (අ) පාඨශාලාවෙන් අස් වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයන් හා අස් වූ දිනයන් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න.) :————.

(ආ) මීට පළමු, ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් හෝ රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු) පළාත් පාලනායතන හා කාල සීමාවන් :————.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත්වූ දිනය :————.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද ? :————.

(ඉ) සේවා මුක්ත හටයෙක් නම්—සේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දිනය හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කථා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :—

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. විශේෂ සුදුසුකම්.—ගැසට් නිවේදනයෙහි සඳහන්කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේනම්, ඒ පිළිබඳව සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබූවේද ? එසේනම් දිනය, නඩු අංකය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස්ද ? එසේ නැත්නම්, ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කොතෙක්ද ? :————.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————.

(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව, පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)

මේ අයදුම් පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයාගනු ලැබුවහොත්, මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්,
තැ. පෙ. 530,
කොළඹ 1.

---

## පළාත් පාලන සේවය

### II වෙනි ශ්‍රේණියේ සුසාන භූමි පාලක තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි :—

2. තනතුරට නියමිත ඒකාබද්ධ වැටුප් ක්‍රමය.—වර්ෂයකට රු. 3,000 න් පටන් ගෙන වර්ෂයකට රු. 90 බැගින් 17 වරක් වැඩිවී වර්ෂයකට රු. 4,530 දක්වා නගී. එහි වර්ෂයකට රු. 3,810 යන වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉමක් ඇත.

3. අවශ්‍ය සුදුසුකම් :

(අ) 1970 ජූලි 28 වැනි දිනට අයදුම්කරුවන් වයස අවුරුදු 21 ට නොඅඩු සහ අවුරුදු 25 ට නො වැඩි විය යුතුය ;

(ආ) අයදුම්කරුවෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ යටත් පිරිසෙයින් සිංහල හෝ දෙමළ සහ උද්භිද විද්‍යාව යන විෂයයනට සම්මාන සාමාර්ථ දෙකක් ද ඇතුළුව සම්මාන සාමාර්ථයන් තුනක් සහිතව දෙවරකට නො වැඩි වාර ගණනකදී විෂයයන් හයකින් ලබාගත් අධ්‍යයන පොදු සහතික විභාගයෙන් හෝ මෙම විෂයයන් ඇතිව මේ හා සමාන හෝ වඩා උසස් විභාගයකින් හෝ සාමාර්ථය ලබා සිටිය යුත්තාහ ;

(ඇ) වතු වැඩ පිළිබඳ සෑහෙන පළපුරුද්දක් හා දැනුමක් මෙන්ම කම්කරු පාලනය පිළිබඳ දැනුමක් හා පළපුරුද්දක් ද අවශ්‍යය.

4. තනතුර ස්ථිරයි. විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගනු ලබන අයදුම්කරු පළමුකොටම කොළඹ නාගරික සභාවේ නාගරික සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට පත් කරනු ලැබේ. කොළඹ නගර සභා සීමාව තුළ වාසය කිරීමට ඔහුට නියම කරනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර, පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට, 1970.7.28 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන ලෙස එවිය යුතුය.

සඳහන් ආකෘති පත්‍රයේ 13 වැනි ඡේදය වෙනුවට මේ කරුණු යොදා ගත යුතුය :—

"13. වතුවැඩ පිළිබඳ සහ කම්කරු පාලනය පිළිබඳ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ විස්තර".

(ඉහත සඳහන් කරුණු සනාථ කිරීමට සහතික පත්‍රවල පිටපත් අයදුම්පතට ඇමිණිය යුතුය.)

7. පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් සහතික නොව) අයදුම්කරුවන් විසින් අයදුම්පත්වලට ඇමිණිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතික හෝ ආධාර ලබන පාඨශාලාවල රෙගුලාසි පද්ධතිය වෙනුවෙන් නිකුත් කරන ලද සහතික හෝ බාරගනු නොලැබේ) ;

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික ;

(ඇ) වතුවැඩ සහ කම්කරු පාලනය පිළිබඳ පළපුරුද්ද සනාථ කිරීම පිණිස සහතික.

8. අයදුම්පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

9. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා සවකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අවසාන දිනට පෙර ලැබුණු බවට සහතික කර ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින් ඔවුන් විසින් ඒවා එවා ගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

10. සුදුසු ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

ඩී. විජේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 ජූනි මස 28 දින,
තැ. පෙ. 530, කොළඹ.

7-412—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### ගණකාධිකාරි තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත්‍ර කැඳවයි.

2 වැටුප.—තනතුරට නියමිත වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය : රු. 6,720—360 × 11—රු. 10,680.

3. පහත සඳහන් අයගේ අයදුම්පත් සලකා බලනු ලැබේ :—

(අ) 70.7.28 වැනි දිනට හය අවුරුදු සේවයක් සම්පූර්ණ කර ඇත්තා වූ පළාත් පාලන සේවයේ I වැනි සහ II වැනි ශ්‍රේණියේ පොත් තබන්නන් ;

(ආ) 70.7.28 දිනට, ලේකම්වරුන් වශයෙන් අවුරුදු 10 කට නො අඩු සේවයක් කර ඇති, පළාත් පාලන සේවයේ I වැනි ශ්‍රේණියේ සිට V වැනි ශ්‍රේණිය දක්වා ශ්‍රේණියන්හි ලේකම්වරුන් ;

(ඇ) 70.7.28 වැනි දිනට ලිපිකරු සේවයේ දස අවුරුදු සේවයක් සම්පූර්ණ කර ඇති ප. පා. ලිපිකරු සේවයේ (සියලුම ශ්‍රේණිවල) නිලධාරීන්, (ගම්සභා ලිපිකරු සේවයේ හා සහකාර ලිපිකරු සේවයේ කරන ලද සේවය 10 අවුරුදු සේවයට ඇතුළත් කළ හැකියි.) ;

(ඈ) 70.7.28 වැනි දිනට සරප් කෙනෙකු වශයෙන් 10 අවුරුදු සේවයක් කර ඇති පළාත් පාලන සරප්වරුන් ;

(ඉ) 70.7.28 වැනි දිනට 10 අවුරුද්දකට නොඅඩු සේවයක් ඇති පළාත් පාලන සේවයේ කාර්මික තනතුරු දරණ නිලධාරීන් ;

(ඊ) ගණකාධිකරණය විෂයයක් වශයෙන් ඇතිව ආර්ථික විද්‍යාව පිළිබඳ උපාධි ලත්, පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරීන් ; සහ

(ඇෆ්) 70.7.28 වැනි දිනට ගබඩා භාරකරුවන් වශයෙන් අවුරුදු 10 ක සේවයක් කර ඇති පළාත් පාලන ගබඩා භාර කරුවන්.

4. සුදුසුකම් සහිත අයදුම්කරුවන්ට පහත සඳහන් නිර්දේශ පත්‍රයට අනුව ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටින ලෙස නියම කරනු ලැබේ.

1 වැනි ප්‍රශ්න පත්‍රය ... (පැය 3 යි)

පිරිවැය ගිණුම ඇතුළත් ගණන් තැබීම.

ද්විත්ව සටහන් පොත් තැබීමේ මූලධර්ම හා භාවිතය.

සීමිත වගකීම් සහිත සමාගම්වලට හා වෙනත් ව්‍යාපාරික සංවිධාන වලට අදාළ නිෂ්පාදන, වෙළඳ, ලාභාලාභ හා විසර්ජන ගිණුම් හා ශේෂ පත්‍ර පිළියෙල කිරීම ඉදිරිපත් කිරීම, ආශ්‍රිත ක්‍රමයේ බැංකු සැසඳුම් ප්‍රකාශ, මූල ධන හා ආදායම්, වැරදි නිවැරදි කිරීම, ප්‍රතිපාදන, සංචිත, සංචිත අරමුදල, ගිණුම්වල ක්ෂය ප්‍රමාණ, සිද්ධාන්ත හා භාවිත ක්‍රම හා විනිමය බිල්.

තීරු ක්‍රමය, තනි කොළ සහ පත් ලැජර, අනු ශීර්ෂ පොත් තැබීම, ස්වයං සමතා ලැජර, අසම්පූර්ණ සටහන් වලින් ගිණුම්, ලැබීම් හා ගෙවීම්, ආදායම් හා වියදම් ගිණුම්, ප්‍රේෂණ ගිණුම්, සාමාන්‍ය දිනය කීර්ති නාමය, ලාබ නැතිවීම ඇතුළුව රක්ෂණ ඉල්ලුම් පත්, ද්විත්ව ගිණුම් ක්‍රමය, කීර්ති නාමය හා විරුවා හැරීම් භාවිතය ඇතුළුව ගිණුම් ක්‍රමය, හවුල් ව්‍යාපාර, සීමා සහිත කොම්පැණි ගිණුම්, දෙපාර්තමේන්තුමය සහ ශාඛා ගිණුම්, කුලියට සින්නවීම් ගිණුම්, නිෂ්පාදන භාග, යන්ත්‍රානුසාර ගිණුම්.

පිරිවැය

පිරිවැය ගණන් තැබීමේ අදහස හා අරමුණ, ද්‍රව්‍ය, කම්කරු, පොදු කාර්ය සඳහා ගණන් තැබීම, අයවැය ලේඛනානුසාරී පාලනය, සම්මත පිරිවැය.

2 වැනි ප්‍රශ්න පත්‍රය ... (පැය 2½ යි)

**පළාත් පාලන මුදල් කටයුතු ඇතුළුව ගණන් පරීක්ෂාව හා මුදල් කටයුතු පිළිබඳ දැනුම**

ගණන් පරීක්ෂාවේ සාමාන්‍ය මූල ධර්මද, ගණන් පරීක්ෂාව අරමුණ හා විෂය සීමාව, ගණන් හරි වැරදි බැලීමේ ක්‍රමය හා ශිල්ප ධර්මය, පරීක්ෂණ හරි වැරදි බැලීම, ගණන් පරීක්ෂණ වැඩ සටහන් මුදල් ගනුදෙණු ගණන් පරීක්ෂාව, වෙළඳ ගනු දෙනු, අපොද්ගල ලැජරය, වත්කම් හා බැඳීම පිරික්සීම.

ගණන් පරීක්ෂකයන්ගේ බලතල, රාජකාරි හා බැඳීම, කොම්පැණි ගිණුම්වල ගණන් පරීක්ෂාව, අභ්‍යන්තර ගණන් පරීක්ෂණ, විශේෂ ගණන් පරීක්ෂණ හා විමර්ශනයන්, අභ්‍යන්තර පාලනය, පළාත් පාලන මුදල් කටයුතු පිළිබඳ දැනුම, පොදු මුදල් කටයුතු, සාමාන්‍ය මුදල් කටයුතු පිළිබඳ දැනුම.

3 වැනි ප්‍රශ්න පත්‍රය ... (පැය 2½ යි)

**පළාත් පාලන නීතිය සහ ආණ්ඩුවේ පාලන හා මුදල් රෙගුලාසි**

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට, 1970.7.28 වැනි දිනට හෝ ඊට පළමු, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන ලෙස එවිය යුතුයි.

7. අයදුම් පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

8. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත නියමිත දින හෝ ඊට ප්‍රථම භාරදී ඇති බවට නාගරික කොමසාරිස් හෝ සභාපතිවරයා විසින් සහතික කොට, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින් ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

9. විභාගය පැවැත්වෙන දිනය සහ වේලාව පසුව දන්වනු ලැබේ.

10. සුදුසුකම් ලත් සියළුම අයදුම්කරුවන්ගේ අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
ලේකම්.

1970 ජූනි මස 30 වැනි දින,
කොළඹ, තැ. පෙ. 530,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

7-411—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

---

# පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම්

## ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත
**(262 වැනි අධිකාරය)**

ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වැනි අධිකාරය වන) 36 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලබන්නේ මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අපේක්ෂකයින් ඔවුන්ගේ නම්වලට කෙලින් ඇති ඒ ඒ කොට්ඨාශයේ නියෝජිතයින් වශයෙන් පෙනී සිටීම සඳහා තෝරා පත් කරන්නට යෙදුන බවය.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
මැතිවරණ කොමසාරිස්,
(ප්‍රාදේශීය බලමණ්ඩල).

1970 ජූනි මස 28 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

| කොට්ඨාශ අංකය | | අපේක්ෂකයාගේ නම |
|---|---|---|
| | **මොණරාගල දිස්ත්‍රික්කය** | |
| | **සින්තරම් පළාත ගම්සභාව** | |
| 1 | ... | කඩහෙට්ටිගේ නන්දිපාල |
| | **රත්නපුර දිස්ත්‍රික්කය** | |
| | **මාරපන ගම් සභාව** | |
| 12 | ... | විතානගේ රත්‍රන්හාමි |
| | **යාපනය දිස්ත්‍රික්කය** | |
| | **මුල්ලිපත්තු ගම් සභාව** | |
| 6 | ... | කොන්ස්ටන්ටයින් අන්තෝනි පිල්ලේ ස්ටැනිස්ලෝස් |

7-425—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

---

# අය-වැය ලේඛන

## බණ්ඩාරගම සුළු නගර සභාව

**මුදල් රෙගුලාසි අංක 40 (11) යටතේ අයදුම් පත්‍රය—1970 අය-වැය ලේඛනය**

1970 වර්ෂයේ අය-වැය ලේඛනයේ ඒ ඒ වැය ශීර්ෂයන් යටතේ වෙන් කරන ලද මුදල් වලින් ඉතිරිවේයයි ගණන් බලන ලද පහත සඳහන් වැය ශීර්ෂයන් යටතේ මුදල් ඊට අනුරූපව දක්වෙන වැය ශීර්ෂවලට මාරුකර අවශ්‍යවී තිබෙන අතිරේක වැය සඳහා එම ශීර්ෂයන් යටතේ යෙදවීමට 70.4.20 දින පවත්වන ලද සභා රැස්වීමේදී අංක 2 (11) දරණ යෝජනාවෙන් සම්මත විය.

## 1. කොටස—සාමාන්‍ය

| මුදල් ඉතිරිවන වැය ශීර්ෂ | රු. | ශ. |
|---|---|---|
| ඒ.—(1) (ජී) සාමාන්‍ය වැය—නිළධාරි වැටුප් ජීවනාධාර ... | 5,686 | 0 |
| ඒ.—(2) (ජී) සාමාන්‍ය වැය—ආයතන වියදම් රථවාහන කහඩු | 150 | 0 |
| බී.—(13) මංමාවත්—ජීවනාධාර ... ... | 2,600 | 0 |
| සී.—(8) නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි ජීවනාධාර ... | 1,039 | 0 |
| ඩී.—(1) (එන්) මහජන සෞඛ්‍ය—සාමාන්‍ය–මාතෘදරකාභිවෘධි | 1,000 | 0 |
| මධ්‍යස්ථානය ... ... | 1,000 | 0 |
| ඩී.—(2) (ඊ) මහජන සෞඛ්‍ය—කැලිකසළ සේවය—ජීවනාධාර ... ... ... | 3,663 | 0 |
| ඩී.—(6) (ඩී) මහජන සෞඛ්‍ය—රෝහල්—ජීවනාධාර ... | 4,456 | 0 |
| | 18,594 | 0 |

| අතිරේක මුදල් අවශ්‍ය වන වැය ශීර්ෂය | රු. | ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වැය :— | | |
| (1) නිළධාරි වැටුප්— | | |
| (ඒ) ලේකම් ... ... ... | 1,700 | 0 |
| (බී) ලිපිකරුවෝ ... ... ... | 2,800 | 0 |
| (සී) ආදයම් පරීක්ෂක... ... ... | 800 | 0 |
| (ඩී) කාර්යාල කාර්ය සහායක ... ... | 1,000 | 0 |
| (2) ආයතන වියදම්— | | |
| (ඒ) දීමනා ... ... ... | 1,000 | 0 |
| (එජ්) ලිපි ද්‍රව්‍ය ... ... ... | 500 | 0 |
| (අයි) නිවාඩු දුම්රිය බලපත්‍ර ... ... | 100 | 0 |
| බී.—මහා මාර්ග :— | | |
| (1) වේතන— | | |
| (බී) පාලකවරු ... ... ... | 800 | 0 |
| (සී) කම්කරුවන් ... ... ... | 2,000 | 0 |
| සී.—(1) මුරකරුවන් වැටුප් ... ... | 1,500 | 0 |
| ඩී.—(2) (ඒ) මහජන සෞඛ්‍ය—කැලිකසළ සේවය දෛනික වැටුප් ... ... ... | 1,000 | 0 |
| ඩී.—(6) (ඒ) මහජන සෞඛ්‍ය—රෝහල් වේතන ... | 5,394 | 0 |
| | 18,594 | 0 |

## 11 කොටස—විදුලි අංශය

| | රු. | ශ. |
|---|---|---|
| විදු.—(9) සාමාන්‍ය ආදයමෙන් කෙරෙන වියදමට ආපසු ... | 1,779 | 0 |
| විදු.—(10) ජීවනාධාර හා විශෙෂ ජීවනාධාර ... | 3,351 | 0 |
| විදු.—(11) අතුරු දීමනා ... ... ... | 870 | 0 |
| | 7,000 | 0 |

| | රු. | ශ. |
|---|---|---|
| විදු.—(2) ප්‍රතිසංස්කරන හා නඩත්තු කිරීම් — | | |
| (සී) මාපක යන්ත්‍ර හා උපකරණ ... ... | 1,000 | 0 |
| විදු.—(4) පාලනය හා සාමාසන්‍ය වියදම්— | | |
| (ඒ) පාලක වේතන ... ... ... | 3,400 | 0 |
| (බී) එලිමහන් සේවක වේතන ... ... | 2,600 | 0 |
| | 7,000 | 0 |

ඩී. සී. ඩබ්ලිව්. කන්නන්ගර,
සභාපති.

1970.5.4 දින,
බණ්ඩාරගම සුළුනගර සභා කායර්‍යාලයේදිය.

අනුමත කරමි.

ලලිත් හෙට්ටිආරච්චි,
ප.පා.ස. කොමසාරිස්—කළුතර.

1970. මැයි මස

7–238— 70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

---

## අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාව

### 1970 වර්ෂයේ පස්වන පරිපූරක අයවැය ලේඛනය

| වැය ශීර්ෂය | ගණන රු. | ශ. | යෝජනා අංකය සහ දිනය |
|---|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් | | | |
| (2) කායර්‍ය මණ්ඩලීය වියදම්— | | | |
| (ඇෆ්) ලිපි ද්‍රව්‍ය, මුද්‍රණ ප්‍රසිද්ධ කිරීම් හා කායර්‍යාලීය කටයුතු ... ... | 366 | 75 | 1970.6.25 දින පවත්වන ලද මාසික රැස්වීමේදී අංක 12(2) දරන සභා සම්මතය |
| සී.—තානායම්— | | | |
| (2) නඩත්තුව ... ... ... | 97 | 40 | එම |
| ඊ.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි— | | | |
| (1) වැටුප් ... ... ... | 119 | 0 | එම |
| (4) නඩත්තුව ... ... ... | 48 | 30 | එම |
| (7) අළුත්වැඩ ... ... | 302 | 5 | එම |
| ඊ.—මහජන සෞඛ්‍ය— | | | |
| (1) සාමාන්‍ය: — | | | |
| (ඊ) විෂබීජ නාශක ද්‍රව්‍ය ... ... | 396 | 0 | එම |
| (ඇම්) මාතෘ නිවාසය සහ ධාරකාභිවෘද්ධි චිකිත්සාගාරය | 3,000 | 0 | එම |
| (2) කුණු කසළ බැහැරලීම:— | | | |
| (සී) ගබඩා බඩු ... ... ... | 327 | 1 | එම |
| (3) වැසිකිළි සුද්ධ කිරීම:— | | | |
| (සී) ගබඩා බඩු ... ... ... | 327 | 1 | එම |
| (ජී) ගොඩනැගිලි තැනීම ... ... | 300 | 0 | එම |
| (6) ආරෝග්‍ය ශාලාව—නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව— | | | |
| (බී) නඩත්තුව ... ... ... | 11,095 | 35 | එම |
| ජී.—සොහොන් බිම්:— | | | |
| (4) අවමගුල් රථය ... ... | 500 | 0 | එම |
| ජේ.—විදුලි දෙපාර්තමේන්තුව — | | | |
| (2) අලුත්වැඩියා කිරීම සහ නඩත්තුව— | | | |
| (සී) මීටර්, ස්විච් යතුරු සහ වෙනත් උපකරණ ... | 447 | 0 | එම |
| (3) කම්බිවලට හා නිවෙස්වලට යා කිරීමේ සේවයන්:— | | | |
| (ඒ) ද්‍රව්‍ය ... ... ... | 2,063 | 0 | එම |
| එකතුව ... | 19,388 | 87 | |

වර්ෂ 1970 ක්වූ ජූනි මස 25 වෙනි දින පවත්වන ලද මාසික රැස්වීමේ අංක 12(2) දරණ සභා සම්මතයෙන් ඒකමතිකව සහා සම්මත වී තිබේ.

ආනන්ද සෝමවීර,
සභාපති.
අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාව.

පළාත් ආණ්ඩු සභා කාර්‍යාලය,
අවිස්සාවේල්ල. 1970.6.25.

7–420—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

# විවිධ දැන්වීම්

## මතුගම සුළු නගර සභාව

### ජල භීතිකා රෝගය

මතුගම සුළු නගර සභා සීමාව තුල ජල භීතිකා රෝග උවදුරු පවතින බැවින් එම නගර සීමාව තුල පිහිටි පෞද්ගලික ගොඩනැගිල්ලක, ගෙමිදුලක හෝ ගෙවත්තක නොවන්නාවූ, අන්‍ය ප්‍රසිද්ධ ස්ථානයක හෝ පාරක හමුවන දඬාවතේ යන නැතහොත් බැඳ නො තබන ලද්දා වූ හෝ දක්කා ගෙන නොයනු ලබන්නාවූ කිසියම් සුනඛයෙකු (බල්ලෙකු හෝ බැල්ලියකු) මා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලබන අයෙකු විසින් එවේලේම විනාශ කරනු ලබන බව, (ලංකාවේ ව්‍යවස්ථාපිත ප්‍රඥප්ති සංග්‍රහයේ 476 වෙනි පරිච්ඡේදය වන) ජලභීතිකා ආඥාපනතේ II වෙනි වගන්තියෙන් ප්‍රකාර මෙයින් ප්‍රකාශනය කරනු ලැබේ.

මෙම ප්‍රකාශනය ගැසට් පත්‍රෙහි පළවන දින සිට හය මාසයක කාලයක් බලපවත්වනව. ඇත.

දයා පී. පස්කුවල්,
සභාපති,
මතුගම සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්‍යාලය,
මතුගම,
1970. 6 30.

7–413—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

## කොළඹ දිස්ත්‍රික්කයේ ඔයබඩපේරුව ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත විස්තර දැක්වෙන මස්පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 272 අධිකාරයෙන් 7(2) වගන්තිය යටතේ පහත දක්වන උපලේඛනයෙහි සඳහන් අයවලුන් විසින් මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1970 වර්ෂයට බලපත්‍ර ඉල්ලා මා වෙත අයදුම්පත් ඉදිරිපත් කර ඇති බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීම ගැන විරුද්ධ වන ඔයබඩපේරුව ප්‍රදේශය සීමාව තුල පදිංචි යම් කෙනෙකු වේ නම්, තමා එසේ විරුද්ධ වන්නේ කුමන හේතු නිසාද යන වග පිටපත් දෙකකින් යුත් ලියවිල්ලකින් මෙම දැන්වීම ගැසට් නිවේදනයේ පළවී දින 14 ක් ඇතුලත මා වෙත ඉදිරිපත් කල යුතු බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත 272 අධිකාරයේ 7 (2) බී වන වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

## උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය සහ වෙළඳාම |
|---|---|
| 1. ඒ. ඇම්. සාලි, තිහාරිය, කළුගෙඩිහේන. | අංක 1. තිහාරිය හත්දිය හරක් මස් කඩය. |
| | 2. තිහාරිය, ගොඩැල්ල හරක් මස් කඩය. |

ඩී. ඊ. විජයසුන්දර,
ඔයබොඩ පේරුව ගම්සභාවේ සභාපති.

1970 ජූනි මස 27 වෙනි දින,
කළුගෙඩිහේන, කලොටුවාව,
ඔයබොඩ පේරුව ගම්සභා කාර්‍යාලයේ දී.

7–227—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

## බත්තරමුල්ල—තලන්ගම සුළුනගර සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

ගෝඝාතක ආඥාපනතේ (272 වැනි අධිකාරය) 17 (1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය පරිදි, නිසි බලධාරියාවූද, කොළඹ දිස්ත්‍රික්කයේ බත්තරමුල්ල–තලන්ගම සුළුනගර සභාවේ සභාපතිවූද, ඩී. පී. විජේසිංහ වන මම, 1970 වර්ෂයේදී මෙහි පහත උපලේඛනයේ සඳහන් දිනයන්හිදී බත්තරමුල්ල–තලන්ගම සුළුනගර සභා සීමාවන් තුළ මස් පිණිස සතුන් මැරීම සහ වෙළෙඳාම පිණිස මස් ප්‍රදර්ශණය කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කරමි.

ඩී. පී. විජේසිංහ,
සභාපති,
බත්තරමුල්ල–තලන්ගම සුළුනගර සභාව.

1970.7.1 වෙනි දින,
බත්තරමුල්ල–තලන්ගම සුළුනගර සභා කාර්‍යාලය,
බත්තරමුල්ල.

## උපලේඛනය

| වර්ෂය | මාසය | | දිනයන් |
|---|---|---|---|
| 1970 ... | ජූලි | ... | ... 3, 11, 18, 25 |
| 1970 ... | අගෝස්තු | ... | ... 1, 9, 16, 23, 31 |
| 1970 ... | සැප්තැම්බර් | ... | ... 8, 15, 22, 29 |
| 1970 ... | ඔක්තෝබර් | ... | ... 4, 7, 14, 22, 29 |
| 1970 ... | නොවැම්බර් | ... | ... 6, 13, 21, 28 |
| 1970 ... | දෙසැම්බර් | ... | ... 5, 12, 20, 27 |

7–415—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

## 1962 කේ අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ බදුල්ල දිස්ත්‍රික්කයේ නිකපොත ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

### යෝජනාව

"ගරු පළාත් පාලන ඇමතිවරයා විසින් සම්පාදනය කරනු ලැබ, 1966 ජූලි මස 8 වැනි දින අංක 14 703 දරණ ගැසට් පත්‍රයේ [illegible] කරන ලද්දාවූ ද උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනා වකින් අනුමත කරන ලද බව 1969 ජනවාරි මස 3 වැනි දින අංක 14,835 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූ ද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 39, 40 සහ 41 වැනි කාණ්ඩ මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැනීමට බදුල්ල දිස්ත්‍රික්කයේ නිකපොත ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි අධිකාරිය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ."

යා. මු. සුදුබණ්ඩා,
සභාපති.

නිකපොත ගම්සභා කාර්‍යාලය,
නිකපොත.
1970 මැයි මස 31 වන දින දිය.

7–417—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

## අනුරාධපුර දිස්ත්‍රික්කයේ මාටඹුවා කෝරලේ ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණත

මෙහි පහත දැක්වෙන උප ලේඛණයේ සඳහන් අය විසින් මස් විකිණීම පිණිස 1970 වර්ෂයට බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධවන අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මාටඹුවා කෝරලේ ගම්ප්‍රදේශයේ ඇතුලත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධවන්නේ අසවල් කරුණ සඳහායයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටිනසේ මෙම දැන්වීම "ගැසට් පත්‍රයේ" පළවන දින සිට 14 දිනක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත යටතේ 201 වෙනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 14 දරණ ආඥාපනතින් සංශෝධන වූ අංක 6 දරණ ආඥාපනත යටතේ දැනුම් දෙමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය හා වෙළඳාම |
|---|---|
| ඇස්. ආර්. අබූබකර්, අංක 14/12, පුංචි මාළිගාවත්ත, කොළඹ. | හබරණ දඹුල්ල පාරේ පැවිරල් ගබඩාව ඉදිරිපිට ඉඩමේ ඇති ගොඩනැගිල්ල. හරක් මස් වෙළඳාම. |

එච්. ඇම්. අප්පුහාමි,
ප්‍රධානතුමා,
මාටඹුවා කෝරලේ ගම්සභාව.

1970 ජූනි 6 වන දින,
පලුගස්වැව,
මාටඹුවා කෝරලේ ගම්සභාව.

7–251—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

---

## හාපිටිගම් කෝරලේ උඩුගහ ගම්සභාව

1970 ජූනි මස 5 වැනි දින අංක 14,909 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වන කොටසේ පළවූ දැන්වීමෙහි 423 වෙනි පිටුවේ කොට්ඨාශ අංක 10—බෝතලේ පහළගම කොටසේ අන්තිමට සඳහන් කොටස වෙනුවට පහත සඳහන් කොටස ආදේශ විය යුතු බව මෙයින් නිවේදනය කරමි:—

**කොට්ඨාශ අංක 10—බෝතලේ පහළගම**

පාරේ නම: අඹුපෙ-පහලමුල්ල පාර;

පාරේ දිග: දම්වැල් 53 යි, අඩි 2 යි. පළල අඩි 16 යි.

| වමට ඇති ඉඩම්වල නම් | දකුණට ඇති ඉඩම්වල නම් |
|---|---|
| 1. ගලබොඩ වත්ත | 1. ගලබොඩ වත්ත |
| 2. කෙවුලුව | 2. කෙවුලුව |

කීණදෙණිය දුම්රිය ස්ථාන පාරෙන් පටන්ගෙන බෝතලේ අඹුපෙ පාරෙන් අවසන් වේ.

මෙම පාරෙන් කොටසක් අංක 8 ගම්සභා කොට්ඨාශයට අයත් වේ.

ආර්. ඇම්. පී. පී. රාජපක්ෂ,
උඩුගහ ගම්සභාවේ සභාපති.

1970.6.29 දින,
මීරිගම, උඩුගහ ගම්සභා කාර්යාලයේදීය.

7–424—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

---

## ඕතර ගම්දෙළහ පත්තුවල ගම්ප්‍රදේශයේ ගම්සභාව

### ගම්සභා ආඥාපනත 257 වැනි පරිච්ඡේදය

කෑගල්ල දිස්ත්‍රික්කයේ ඕතර හා ගම්දෙළහ පත්තු වල ගම්ප්‍රදේශයේ ගම්සභාව විසින් පහත සඳහන් යෝජනාව සම්මත කරගත් බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

පී. ජී. පුංචිනිලමේ,
ඕතර ගම්දෙළහ පත්තු ගම්සභාව.

ගම්සභා කාර්යාලය,
ඉඹුල්ගස්දෙනිය,
දේවාලේගම,
1969.9.6.

#### යෝජනාව

"1952 අංක 6 දරණ ප්‍රදේශ අධිකාරි සහා පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා අඥපනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඕතර ගම්දෙළහ පත්තු වල ගම්ප්‍රදේශයේ ගම්සභාව විසින් වර්ෂ 1954 ක්වූ අප්‍රේල් මස 9 වැනි දින අංක 10,662 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද යෝජනාවෙන් සම්මත කර ගන්නා ලද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා 4 වැනි කාණ්ඩයේ 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ ප්‍රකාර මෙහි පහත සඳහන් මංමාවත් එකිනෙක ඉදිරියෙන් සඳහන් දිග හා පළල අනුව සාද හෝ නැවත සාද පවත්වා ගෙන යනු ලබන බව මෙයින් යෝජනා කරනු ලැබේ.

| පාරේ අංකය | පාරේ නම | දිග | පළල |
|---|---|---|---|
| | | දම්වැල් | |
| 182 ... | කහවත්ත-රන්වල පාර ... | 40 ... | පාරමැද සිට එක් පැත්තකට අඩි 7 ක් වන සේ අඩි 14 යි |
| 183 ... | රන්වල—ඕපාත පාර ... | 3½ ... | එම |
| 184 ... | රන්වල—කෝදපාලුව පාර ... | 30 ... | එම |
| 185 ... | කෝදපාලුව—රන්වල පාර ... | 40 ... | එම |
| 186 ... | වද්දෙනිය මංකඩ පරණ දෙවට පාර සහ වද්දෙනිය—වළකුඹුර පාළම දක්වා ඇති අළුත් පාර | 16¼ ... | පළල අඩි 16 යි |

අංක 186 දරණ පාර පහත සඳහන් සේ වෙනස් කොට තැනීමටද තීරණය විය. මෙම පාරේ මෝදර වත්තේ මායිමේ සිට අඩි 10 ක් පළල් අඩි 590 ක් දිග බිම් ප්‍රමාණය වසා දමා එම බිම් ප්‍රමාණය ඇම්. එච්. ජේ. පෙරේරා මහතාට පවරා දීමටත්, ඇම්. එච්. ජේ. පෙරේරා මහතාගේ මෝදර වත්ත නැමති ඉඩමෙන් ගම්සභාවට පවරාදී ඇති අඩි 16 × 1,063 ක් වන බිම් ප්‍රමාණය පාර තැනීම සඳහා යෙදීමටත්ය.

7–226—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

---

## පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තඹාල මැදපත්තු උතුරු ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අය එහි සඳහන් ස්ථානයෙහි 1970 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා බලපත්‍ර ඉල්ලා අයදුම් පත් මා වෙත එවා තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පනතේ (272 වැනි අධිකාරය) 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. එකී බලපත්‍ර නිකුත් කිරීම ගැන පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තඹාල මැදපත්තු උතුරු ගම් සභා සීමාව තුල පදිංචි යම් කෙනෙකු විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇ විරුද්ධ වන්නේ කුමන හේතුන් නිසාද යනවග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුතුව මෙම දැන්වීම ගැසැට් පත්‍රයේ පලවූ දින සිට දින 14 ක් ඇතුලත මා වෙත එවිය යුතු බව මෙයින් දන්වා සිටිමි.

එස්. ඒ. ඒ. මජීඩ,
සභාපති තැන,
මැදපත්තු උතුරු ගම්සභාව.

1970 ජූනි 25 වෙනි දින,
පොළොන්නරුවේ,
තඹාල,
මැදපත්තු උතුරු ගම්සභා කාර්යාලයයේදීය.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | වෙළඳාමේ ස්වභාවය | ස්ථානය |
|---|---|---|
| ඒ. එම්. ජමාල්දීන් ... | එළහරක් මස් ... | සූංගාවිල ගම |

7–418—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් ඊළඟ ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුයි.

## උපලේඛනය

## 1970

| මාසය | පළ කිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| ජූනි | 70. 6. 5 සිකුරාද | 70. 5.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.11 බ්‍රහස්පතින්ද | 70. 6. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.18 බ්‍රහස්පතින්ද | 70. 6.11 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 6.25 බ්‍රහස්පතින්ද | 70. 6.18 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| ජූලි | 70. 7. 2 බ්‍රහස්පතින්ද | 70. 6.25 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 7.10 සිකුරාද | 70. 7. 2 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 7.17 සිකුරාද | 70. 7.10 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.24 සිකුරාද | 70. 7.17 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.31 සිකුරාද | 70. 7.24 සිකුරාද | දහවල් | 12.0 |
| අගෝස්තු | 70. 8. 7 සිකුරාද | 70. 7.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 8.14 සිකුරාද | 70. 8. 7 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.21 සිකුරාද | 70. 8.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.28 සිකුරාද | 70. 8.21 සිකුරාද | ප.ව. | 3.30 |
| සැප්තැම්බර් | 70. 9. 4 සිකුරාද | 70. 8.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.11 සිකුරාද | 70. 9. 4 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.18 සිකුරාද | 70. 9.11 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.25 සිකුරාද | 70. 9.18 සිකුරාද | ප.ව. | 3.30 |
| ඔක්තෝබර් | 70.10. 2 සිකුරාද | 70. 9.25 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10. 9 සිකුරාද | 70.10. 2 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.16 සිකුරාද | 70.10. 9 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.23 සිකුරාද | 70.10.16 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.30 සිකුරාද | 70.10.23 සිකුරාද | ප.ව. | 3.30 |
| නොවැම්බර් | 70.11. 5 බ්‍රහස්පතින්ද | 70.10.30 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.11.12 බ්‍රහස්පතින්ද | 70.11. 5 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.20 සිකුරාද | 70.11.12 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.27 සිකුරාද | 70.11.20 සිකුරාද | දහවල් | 12.0 |
| දෙසැම්බර් | 70.12. 4 සිකුරාද | 70.11.27 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.11 සිකුරාද | 70.12. 4 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.18 සිකුරාද | 70.12.10 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.24 බ්‍රහස්පතින්ද | 70.12.17 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.31 බ්‍රහස්පතින්ද | 70.12.24 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 මාර්තු 5 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී